## බදාදා

පළමුවන කියැවීම 2 මකබ් 7: 1, 20-31

මකබ්වරුන්ගේ දෙවන පොතෙන් ගත් පාඨයෙකි.

**"ලොව මැවූ දෙවි තුමාණෝ ඔබට හුස්ම සහ ප්‍රාණය යළි දෙන සේක."**

සහෝදරයන් සත් දෙනෙක් ද ඔවුන්ගේ මව සමඟ අත් අඩංගුවට ගන්නා ලදහ. ඔවුන්ට කසයෙන් හා කටු සැමිටිවලින් වධ හිංසා දෙමින්, ඔවුන්ටත් නීති විරෝධී ඌරු මස් කවනු සඳහා රජ තෙම බලාත්කාරකම් කළේය.

ඒ මව විශේෂයෙන් ම ප්‍රශංසනීය වූ ගෞරවාන්විත ලෙස සිහි කළ යුතු කාන්තාවකි. මන්ද ඇය එක දවසක් ඒ තුළ දී ම පුත්‍රයන් සත් දෙනෙකුගේ මරණය දෙස බලා සිට, ඇය සමිඳාණන් වහන්සේ තුළ බලාපොරොත්තුව තැබූ බැවින් ඒ සියල්ල නිර්භීත ලෙස ඉවසා ගත්තා ය. සැබැවින් ම ඇය ස්වකීය මුතුන්මිත්තන්ගේ භාෂාවෙන් කතා කරමින් ඔවුන් එකිනෙකා දිරිමත් කළාය.

උතුම් පැහැදීමකින් පූර්ණ වී ඇය වැනි ස්ත්‍රියකගේ තර්කය පිරිමියකුගේ ධෛර්යයෙන් පණ ගන්වමින් ඔවුන් අමතා, 'ඔබ හැම මාගේ කුසය තුළ පිළිසිඳ ගත්තේ කෙසේ දැ යි මම නොදනිමි. ඔබට හුස්ම සහ ප්‍රාණය දුන්නේ මා නොවේ. ඔබේ අවයවයන් හැඩ ගැසුවේ මා නොවේ. ඒවා කළේ, මිනිසාගේ උපත සංවිධානය කරමින් සියල්ලේ ආරම්භයට මූලිකත්වය දරන ලෝකයේ මැවුම්කාරයාණෝ ය. උන් වහන්සේගේ ව්‍යවස්ථාව නිසා ඔබ ම ඔබේ ජීවිතය හෙළාදකින බව දකින එතුමාණෝ දයාව පාමින් ඔබට සැබැවින් ම හුස්ම සහ ප්‍රාණය යළි දෙන සේකැ'යි කීවාය.

ඇන්ටිඔකස් වනාහි ඇගේ කට හඬෙහි යම් කිසි අපහාසයක් ඇතැයි සැක කර, ඇය තමාට සමච්චල් කරන්නී යයි සිතීය. තවද, බාලයා තවමත් පණ පිටින් සිටි බැවින් වචනයෙන් පමණක් නොව දිව්රුම් පොරොන්දු පිට ඔහු ඔහුගේ මුතුන්මිත්තන්ගේ ගතානුගතික සම්ප්‍රදායයන් අත් හරින්නේ නම් ඔහු ධනවත් කොට ප්‍රීතියට පත් කරන බව කියා ඔහුට ආයාචනා කළේය. තවදුරටත් ඔහු තමාගේ මිතුරකු බවට පත් කරගෙනන ප්‍රසිද්ධ නිල පදවියක් ඔහුට දෙන බව ද ඔහුට කියන ලදි. එහෙත් ඒ තරුණයා මේ ගැන කිසිම සැලකීමක් නොදැක්වූයේ ය. එබැවින් රජ තෙම මවට කතා කොට, තරුණයාගේ ජීවිතය බේරා ගන්නා ලෙස ඔහුට අවවාද කරන මෙන් ඇයගෙන් ඉල්ලීය. ඔහු බොහෝ වාරයක් මෙසේ ඉල්ලූ පසු ඇය තම පුතා එකඟ කරවා ගැනීමට උත්සාහ කළාය.

ඇ ඔහු වෙත හැරී කෲර පාලකයා විහිළුවට පාත්‍ර කරමින් තම මුතුන් මිත්තන්ගේ භාෂාවෙන් කතා කරමින්, ඔහු අමතා, "මාගේ පුතුනි, මට අනුකම්පා කරන්න. මම නව මසක් ඔබ මගේ කුසයේ උසුලාගෙන ගියෙමි. අවුරුදු තුනක් කිරි දුනිමි. ඔබට කවා පොවා අද ඔබ සිටින මේ තත්ත්වයට මම ඔබ ගෙනාවෙමි. මාගේ දරුව, අහස හා පොළොව දෙස බලන මෙන් මම ඔබගෙන් ඉල්ලමි. ඒවායේ ඇති සියල්ල ගැන මෙනෙහි කොට කලින් නොතිබුණු දෙයකින් දෙවියන් වහන්සේ මේ සියල්ල මැවූ බවත් එලෙස ම මනුෂ්‍ය වර්ගයා ජීවිතය ලබා ගන්නා බවත් පිළිගන්න. මේ අළුගෝසුවාට බිය නොවන්න. ඔබත් ඔබගේ සහෝදරයන්ගෙන් කෙනෙකු බව ඔප්පු කරන්න. එබැවින් දයාවේ දවසේ දී මා ඔබ ද ඔබේ සහෝදරයන් ද සමඟ පිළිගන්නා ලෙස මරණය සාදරයෙන් පිළිගන්නැ"යි කීවාය.

ඇ මෙසේ කියා අවසාන කිරීමට පෙර තරුණයා පිළිතුරු දෙමින් මෙසේ කීවේය. "ඔබ සැම කුමක් නිසා බලා සිටින්නහු ද? රජුගේ නියෝගයට මම එකඟ නොවෙමි. මෝසෙස් මගින් අපේ මුතුන්මිත්තන්ට දෙන ලද ව්‍යවස්ථාවේ නියෝගයට මම එකඟ වෙමි. හෙබ්‍රෙව්වරුන්ට විරුද්ධව සැම නපුරක්ම යෙදීමට උත්සාහ කළ ඔබ, සැබැවින්ම දෙවියන් වහන්සේගේ අතින් නොමිදෙන්නහු ය."

දේව වචනය මෙසේ ය.

පිළිතුරු ගීය

පිළිතුර: සමිඳුනි ධර්මිෂ්ඨයෝ ඔබ වහන්සේගේ මුහුණ දකින්නෝ ය.

ගීය:

සමිඳුනි, මාගේ මේ සාධාරණ යැදුමට සවන් දුන මැනව.
මාගේ හඬ ගැසීමට කන් දුන මැනව. මන්ද, මා එය පුදන්නේ අවංක සිතිනි.

ඔබ පැවසූ දහම් මගෙහි ගමන් කළෙමි. ඉන් ඉවත් ව මා නික්ම ගියේ නැත.
දෙවිඳුනි, මට පිළිතුරු දෙන නිසා මම ඔබට හඬ ගසමි.
මා අයැදුමට කන් යොමු කළ මැනව. මාගේ බස් ඇසුව මැනව.

ඔබේ ම දෙනෙත රක්නා සේ මා රැක ගන්න. ඔබ පියාපත් සෙවණෙහි සුරැකිව මා සඟවන්න.
මා දමිටු හෙයින් මම ඔබේ මුහුණ දකින්නෙමි. මා අවදි වන කල ඔබේ ස්වර්ගය දැක සැහීමකට පත් වන්නෙමි.

සුපුවත් ජය නද (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
"යමෙක් දෙවියන් වහන්සේගේ දහම පිළිපදින්නේ ද
ඒකාන්තයෙන්ම ඔහු තුළ උන්වහන්සේගේ ප්‍රේමය සම්පූර්ණ වී ඇත."
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
"ඔබ මා තෝරා ගත්තේ නැත. මම ඔබ තෝරා ගෙන පත් කළෙමි.
එසේ කළේ ඔබ ගොස් බොහෝ පල දරන පිණිසත්,
ඔබේ පල පවතින පිණිසත්,
මාගේ නාමයෙන් ඔබ පියාණන් වහන්සේගෙන් ඉල්ලන කවර දෙයක් වුව ද
උන්වහන්සේ ඔබට දෙන පිණිසත් ය."
ආලේලූයා!

සුවිශේෂය

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි. ලූක් 19: 11-28

**"ඔබ මාගේ මුදල් බැංකුවේ තැන්පත් නොකළේ මන්ද?"**

ජේසුස් වහන්සේ තවත් උපමාවක් වදාළ සේක.

එය වදාළේ, උන්වහන්සේ ජෙරුසලමට සමීපව සිටි බැවින් හා දෙවියන් වහන්සේගේ රාජ්‍යය වහාම එළිදරව් වනු ඇතැයි ඔවුන් සිතූ බැවිනි. "රදළ පෙළෙහි වූ එක් මනුෂ්‍යයෙක් රාජ පදවියක් ලබා එනු පිණිස දුර රටකට පිටත්ව ගියේය. ඔහු තමාගේ දාසයන් දස දෙනෙකු කැඳවා ඔවුන් එකිනෙකාට රන් කාසියක් බැගින් දී "මා එනතුරු මෙයින් වෙළහෙළඳාම් කරන්නැ"යි කීය. එහෙත් ඔහුගේ නගර වැසියෝ ඔහුට වෛර වී, 'මේ මනුෂ්‍යයා අප කෙරෙහි රජකම් කිරීම අපගේ කැමැත්ත නොවේ ය'යි කියනු පිණිස නියෝජිත පිරිසක් ඔහු

පස්සේ යැවූහ. ඔහු රාජ පදවිය ලබා පෙරළා ආ විට, තමා මුදල් දුන් දාසයෝ වෙළෙහෙළදාමෙන් කොපමණ උපදවා ගත්තෝ දැයි දැනගන්නා පිණිස ඔවුන් තමන් වෙත කැඳවන්න අණ කළේය. පළමුවැන්නා ඔහු ඉදිරියට අවුත්, ‘ස්වාමිනී, ඔබේ එක රන් කාසියෙන් රන් කාසි දහසක් උපදවා ගතිමි’යි කීය. ඔහු කතා කොට ‘ඉතා හොඳය, යහපත් වූ දාසය ඔබ ඉතා සුළු දෙයක් ගැන විශ්වාසී වූ බැවින් නගර දහසක් කෙරේ අධිපති වන්නැ’යි ඔහුට කීය. දෙවැන්නා ද අවුත් ‘ස්වාමිනී, ඔබ දුන් රන් කාසියෙන් පහක් උපදවා ගතිමි’යි කීය. එවිට ඔහු ‘ඔබත් නගර පහක් කෙරේ අධිපති වන්නැ’යි ඔහුට කීය. තවත් කෙනෙක් අවුත් ‘ස්වාමිනී, මෙන්න ඔබේ රන් කාසිය, එය රෙදි කඩක ඔතා තැබීමි. මන්ද, ඔබ නුදුන් දෙය ගන්නා වූ, නොවපුළ දෙය කපන්නා වූ දැඩි සිතක් ඇති කෙනෙකු බැවින් ඔබට බිය වූයෙමි’යි කීය. එවිට ඔහු කතා කොට ‘නපුරු දාසය, ඔබේම වචනවලින් ඔබ විනිශ්චය කරමි. මා නුදුන් දෙය ගන්නා වූ නොවපුළ දෙය කපන්නා වූ දැඩි සිතක් ඇති කෙනෙකු බව ඔබ දැන සිටියෙහි ය. එසේ නම් මා ආ විට පොලියත් සමග අය කර ගනු පිණිස මාගේ මුදල් බැංකුවේ තැන්පත් නොකළේ මන්ද? කියා ළඟ සිටිය වුන්ට කතා කොට ‘ඒ කාසිය ඔහුගෙන් ගෙන කාසි දසය ඇත්තාට දෙන්නැ’යි කීය. එවිට ඔව්හු ‘ස්වාමිනී, ඔහුට කාසි දහසක් ඇතැ’යි කීහ. ඇති හැමට වැඩියෙනුත් දෙනු ලැබේ. නැති අයගෙන් ඇති දෙයත් ගනු ලැබේ ය’යි මම ඔබට කියමි. එසේ වුව ද මා තමන් කෙරේ රජකම් කරනවාට කැමැති නොවූ මේ මාගේ සතුරන් මෙහි ගෙනවුත් මා ඉදිරියෙහිම මරා දමන්නැ’යි කීවේය.” උන්වහන්සේ මෙවදන් දෙසා ජෙරුසලමට යන පිණිස ඔවුන්ට පෙරටුව වැඩි සේක.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.